Singala

2 6 FEB 2026

# சமத்துவக்கட்சி

# யாப்பு

# සමත්තුව කඩ්චි

# ව්‍යවස්ථාව

# SAMATHTHUVA KADCHI

# CONSTITUTION

M. Chandrakumar
Ex MP & DCC Parliament
General Secretary
Samaththuva Kadchi

# ව්‍යවස්ථා විධිවිධාන

# CONSTITUTION

1. පක්ෂයේ නම

“සමත්තුව කඩ්චි”ලෙස හඳුන්වනු ලැබේ. SAMATHTHUVA KADCHI

2. පක්ෂයේ ලිපිනය

අංක 03, පළමු පටුමග, කනකපුරම් ,කිලිනොච්චි, කිලිනොච්චි දිස්ත්‍රික්කය, ශ්‍රී ලංකාව

No 03. 1st Lane, Kanagapuram ,Kilinochchi, Kilinochchi District, Sri Lanka.

3. පක්ෂ ධජය

පක්ෂය සඳහා වෙනම ධජයක් තිබේ. එය රතු, කහ සහ සුදු යන වර්ණවලින් සමාන අනුපාතයකින් ඇති අතර දිග සහ පළල 2:1 අනුපාතයකින් සකස් කරනු ඇත.

4. ඉලක්ක සහ අරමුණු

**4.1. දැක්ම (Vision)**

ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකමකින් පදනම්වූ පාලන ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් සමානාත්මතාවය, සමාජ සාධාරණත්වය, සාමය සහ සමෘද්ධියෙන් පිරුණු දියුණු, බහුත්වවාදී ශ්‍රී ලාංකාවයි.

**4.2 මෙහෙවර (Mission)**

රජයේ ප්‍රධාන අංග ලෙස ව්‍යවස්ථාදායකය, අධිකරණය සහ රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රයේ හා පොදු ක්ෂේත්‍ර පරිපාලනයේ සහ පළාත් සභා, පළාත් පාලන සභා ආයතන , ඒවා යටතේ ඇති පරිපාලන ව්‍යුහයන් සහ සියලුම සිවිල් සමාජ සංවිධානයේ සමානාත්මතාවය සහ සමාජ සාධාරණත්වය පිළිබඳ මූලධර්ම යනාදිය ඵලදායීව, කාර්යක්ෂමව පවත්වාගෙන යාමට සහ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සියලු පියවර ගැනීම. ඒ මඟින් ඉතා යහපත් සමාජයක් සහ ශ්‍රී ලාංකික භූමිය ගොඩනැගීම.

M. Chandrakumar
Ex MP & DCC Parliament
General Secretary
Samaththuva Kadchi

### 4.3. අරමුණු (Objectives)

පක්ෂය තම දේශපාලන වැඩපිළිවල පහත සඳහන් අරමුණු මත කරනු ඇත.

4.3.1. ජනතාව තුළ බුද්ධිමත්ව සිතීමට සහ දේශපාලනයට සහභාගී වීමට දේශපාලන දැනුවත්භාවය ඇති කිරීම.

4.3.2. සමානාත්මතාවය සහ සමාජ සාධාරණත්වය මත පදනම් වූ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන අදහස් ජනතාව අතර ප්‍රචාරය කිරීමඹු ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම.

4.3.3. නීතිය, සාමය හා සමානාත්මතාවය ස්ථාපිත කිරීම. සමාජයේ පාර්ශවයට, විශේෂයෙන් දුර්වල කොටස්වලට සහ පීඩිතයන්ට සේවය කිරීම.

4.3.4.1. ජාති, ආගම්, භාෂා හෝ කලාපීය වෙනස්කම් නොමැතිව "අපි ශ්‍රී ලාංකිකයන්" යන අදහස මත ජනතාව අතර ජාතික සමගිය සහ එකමුතුකම ඇති කළ හැකි දේශපාලන චින්තන නිර්මාණය කිරීම. සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම.

4.3.4.2. දෙමළ කතා කරන ප්‍රජාවේ අනන්‍යතාවය සහ සංවර්ධනය සඳහා ඇති අයිතිය ආරක්ෂා කරමින් අනෙකුත් ප්‍රජාවන් සමඟ සමානාත්මතාවය තහවුරු කිරීම.

4.3.4.3. දේශපාලනය සමාජ වගකීමක් ලෙසත් ජාතික වගකීමක් ලෙසත් කටයුතු කිරීමට හැකිවන පරිදි පක්ෂ සාමාජිකයින් සහ ආධාරකරුවන් පුහුණු කිරීම සහ බිහිකිරීම.

4.3.4.4. ජනතාවගේ යහපත සඳහා පමණක් දේශපාලන බලය භාවිතා කරන වගකිවයුතු සහ යුතුකම පිළිබඳ සවිඥානික ජනතා නියෝජිතයන් නිර්මාණය කිරීම.

4.3.4.5. රටේ පොදු යහපත සහ පොදු අරමුණු සඳහා ගුණාත්මකභාවයෙන් ක්‍රියාත්මක වන ප්‍රගතිශීලී දේශපාලන පක්ෂ, වෘත්තීය සමිති සහ සිවිල් සමාජ සංවිධාන සමඟ හවුල්කාරිත්වයෙන් සහ සහයෝගීතාවයෙන් වැඩ කිරීම.

4.3.4.6. උපදේශනයඹු සාමූහික වගකීමඹු විනිවිදභාවය සහ වගවීම වැනි සමානාත්මතාවය සහ සමාජ සාධාරණත්වයේ වටිනාකම් මත ක්‍රියාත්මක වන පක්ෂයේ සියලු මට්ටම්වල පාලනය සහ නායකත්වය ස්ථාපිත කිරීම.

4.3.4.7. දූෂණයඹු වංචාවඹු නාස්තියඹු බලය අනිසි ලෙස භාවිතා කිරීමඹු අල්ලස් ගැනීමඹු ප්‍රචණ්ඩත්වයට පෙළඹවීම සහ පක්ෂග්‍රාහී ලෙස කටයුතු කිරීමට පෙළඹවීම ඇතුළු සමාජ විරෝධී ක්‍රියාකාරකම්වලට එරෙහිව ක්‍රියා කිරීම.

4.3.4.8. ජනතාවගේ අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කරමින්ම් සැලසුම් සහගත පදනමක් මත රටේ සම්පත් ඵලදායී හා කාර්යක්ෂමව භාවිතා කිරීමෙන් තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම

4.3.4.9. සාමය, සමානාත්මතාවය සහ සහජීවනය තුළින් සංවර්ධිත, බහුත්වවාදී ශ්‍රී ලාංකික ජාතියක් ගොඩනැගීම.

4.3.4.10. සොබාදහමට හා පරිසරයට එරෙහි ක්‍රියාකාරකම් වැළැක්වීම සහ ආරක්ෂා කිරීම

## 5. ක්‍රමය (Methodology)

රටේ නීති සහ රෙගුලාසි වලට ගරු කරමින් සහ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේද සහ යහපාලනයේ වටිනාකම් අනුගමනය කරමින් පක්ෂයේ සියලුම කටයුතු සිදු කිරීම.

## 6. සාමාජිකත්වය (Membership)

6.1. සාමාජිකත්ව සුදුසුකම්

6.1.1. පක්ෂයේ අරමුණු සහ වැඩපිළිවෙල පිළිගන්නා, වයස අවුරුදු 18 සම්පූර්ණ කළ ශ්‍රී ලාංකික පුරවැසියන් වන පිරිමි සහ ගැහැණු යන දෙපිරිසටම අයදුම් කිරීමෙන් සම්බන්ධ විය හැකිය.

6.1.2. සාමාජිකයෙකු ලෙස සම්බන්ධ වන සෑම පුද්ගලයෙකුම සාමාන්‍ය සාමාජිකයෙකු ලෙස සහ ජීවිත කාලීන සාමාජිකයන් ලෙසද ඇතුළත් කර ගනු ලැබේ.

6.1.3 සාමාන්‍ය සාමාජිකයෙකුට රුපියල් පන්සියයක (රු. 500) වාර්ෂික දායකත්වයක් ගෙවීමෙන් සහ ජීවිත කාලීන සාමාජිකයෙකුට රුපියල් පන්දහසක (රු. 5000) ගෙවීමෙන් සාමාජිකත්වය ලබා ගත හැකිය.

6.1.4. එවැනි සාමාජිකයින් පක්ෂයේ මූලධර්ම හා අරමුණු සමඟ ගැටෙන වෙනත් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ සංවිධානයකට හෝ ආයතනයේ සාමාජිකයෙක් නොවිය යුතුය.

6.1.5 දූෂණය, වංචාව, අල්ලස් ගැනීම, ප්‍රචණ්ඩත්වය හෝ දුරාචාරය වැනි සමාජ විරෝධී ක්‍රියාකාරකම්වල නියැලීම සම්බන්ධයෙන් ශ්‍රී ලාංකික අධිකරණයකින් වරදකරු වී නොතිබිය යුතුය, විනය ක්‍රියාමාර්ගවලට යටත් වී නොතිබිය යුතුය, නැතහොත් සමාජයෙන් ප්‍රතික්ෂේප වී නොතිබිය යුතුය.

## 6.2 සාමාජිකත්ව වර්ග (Categories of Membership)

6.2.1 ආරම්භක සාමාජිකයින් (Founder Members)

6.2.2. මුල් සාමාජිකයන් (Primary Members)

6.2.3. ආශ්‍රිත සාමාජිකයින් (Associate Members)

6.2.4. ක්‍රියාකාරි සාමාජිකයින් (Active Members)

6.2.5. ගෞරවනීය සාමාජිකයන් (Honorary Members)

## 6.3 ආරම්භක සාමාජිකයින් (Founder Members)

6.3.1 පක්ෂය ගොඩනැගීමට සහ සංවර්ධනය කිරීමට අඛණ්ඩව සහ කැපවීමෙන් සම්බන්ධ වී ඇති ජ්‍යෙෂ්ඨ සාමාජිකයින් නායකත්ව මණ්ඩලය විසින් තහවුරු කර ආරම්භක සාමාජිකයින් ලෙස පිළිගනු ලැබේ.

6.3.2 ආරම්භක සාමාජිකයින් පක්ෂයේ ස්ථිර සාමාජිකයින් වන අතර පක්ෂයේ පරිපාලන ව්‍යුහයේ නායකත්ව මණ්ඩලය, මෙහෙයුම් කමිටුව, දේශපාලන කණ්ඩායම් ආදියෙහි ප්‍රධාන චරිත ලෙසද කටයුතු කරයි.

6.3.3 ආරම්භක සාමාජිකයින්ට පක්ෂයේ අභ්‍යන්තර මැතිවරණවලදී සහ නායකත්ව මණ්ඩලය විසින් අවශ්‍ය යැයි සැලකෙන කරුණු වලදී ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ඇත.

## 6.4. ප්‍රාථමික සාමාජිකයින් (Primary Members)

6.4.1. සාමාජික සුදුසුකම් ලබා ඇති අයට පක්ෂයේ ප්‍රාථමික සාමාජිකයින් වීමට අයදුම් කළ හැක.

6.4.2. මෙවැනි අයදුම්පත් ප්‍රාදේශීය හෝ ග්‍රාම හෝ නගරය හෝ පළාත් පාලන හෝ දිස්ත්‍රික් මෙහෙවුම් කමිටුව විසින් සලකා බලා ජාතික සාමාජික කමිටුවට ඉදිරිපත් කිරීම.

6.4.3. මේ ආකාරයෙන් ඉදිරිපත් කරන ලද අයදුම්පත් ජාතික සාමාජික කමිටුව විසින් පිළිගනු ලැබුවහොත්, අයදුම්කරුවන් පක්ෂයේ ආරම්භක සාමාජිකයන් ලෙස ඇතුළත් කරනු ලැබේ.

6.4.4. ආරම්භක සාමාජිකයින්ට පක්ෂ අභ්‍යන්තර මැතිවරණවලදී හෝ ප්‍රධාන තීරණ වලදී ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය නොමැත.

6.5. ආශ්‍රිත සාමාජිකයින් (**Associate Members**)

6.5.1 ප්‍රාථමික සාමාජිකයෙකු ප්‍රාථමික සාමාජිකයෙකු ලෙස ඇතුළත් වූ දින සිට වසරකට පසු ආශ්‍රිත සාමාජිකත්වය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

6.5.2 ආශ්‍රිත සාමාජිකත්වය සඳහා අයදුම්කරුවෙකු තම අයදුම්පත ප්‍රාදේශීය හෝ ග්‍රාම හෝ නගරය හෝ පළාත් පාලන හෝ දිස්ත්‍රික් විධායක කමිටුව හරහා ජාතික සාමාජික කමිටුව විසින් සලකා බැලීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

6.5.3 ජාතික සාමාජික කමිටුවේ නිර්දේශය මත නායකත්ව මණ්ඩලය විසින් ආශ්‍රිත සාමාජික අයදුම්පත් සම්බන්ධයෙන් තීරණ ගනු ලැබේ.

6.5.4 දිස්ත්‍රික්, ග්‍රාම, නගර හෝ පළාත් පාලන මට්ටමින් පැවැත්වෙන අභ්‍යන්තර පක්ෂ මැතිවරණවලදී වැදගත් තීරණ වලදී ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය සහකාර සාමාජිකයින්ට ඇත.

6.6. ක්‍රියාකාරී සාමාජිකයන් (Active Members)

6.6.1 ආශ්‍රිත සාමාජිකයෙකු ලෙස ඇතුළත් කර ගන්නා පුද්ගලයෙකු පක්ෂයේ ප්‍රතිපත්තිවලට අනුකූලතාවය,අගය, ක්‍රියා පටිපාටි, ඉලක්ක සහ දේශපාලන සංස්කෘතිය අවංකව වැළඳගෙන අවම වශයෙන් වසර තුනක් (03) ක් පක්ෂයේ ක්‍රියාකාරකම්වල ක්‍රියාකාරීව සහ අඛණ්ඩව සම්බන්ධ වී ඇති පුද්ගලයෙකු විය යුතුය.

6.6.2. සාමාජික කමිටුවේ නිර්දේශය මත පදනම්ව ක්‍රියාකාරී සාමාජිකයින්ගේ අයදුම්පත් සම්බන්ධයෙන් නායකත්ව මණ්ඩලය තීරණ ගරයි.

6.6.3 ක්‍රියාකාරී සාමාජිකයින් පක්ෂයේ තනතුරු සහ වගකීම් සඳහා පත් කිරීමට සුදුසුකම් ලබයි. පක්ෂය විසින් ගනු ලබන වැදගත් තීරණ වලදී සහ අභ්‍යන්තර මැතිවරණවලදී ක්‍රියාකාරී සාමාජිකයින්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ඇත.

6.7. ගෞරවනීය සාමාජිකයින් (**Honorary Members**)

6.7.1 පක්ෂයේ වැඩසටහන් පොහොසත් කළ හැකි වෘත්තීය දායකත්වයක් ලබා දිය හැකි අය ගෞරවනීය සාමාජිකයින් ලෙස ඇතුළත් කරනු ලැබේ. නායකත්ව මණ්ඩලයේ සාමාජිකයින්ගේ යෝජනාව මත මෙම අයගේ සාමාජිකත්වය අනුමත කරනු ඇත.

6.7.2 මෙසේ ඇතුළත් කර ගන්නා ගෞරවනීය සාමාජිකයින් ඡන්ද අයිතිය ඇති සාමාජිකයින් නොවන නමුත් පක්ෂයේ පුළුල් අරමුණු සහ ක්‍රියාකාරකම් සඳහා සහාය දක්වන අය වනු ඇත.

6.8. සාමාජිකත්වය අහිමි වීම / සාමාජිකත්වය අවසන් කිරීම

පහත සඳහන් අවස්ථා වලදී පුද්ගලයෙකුගේ සාමාජිකත්වය අහිමි කිරීම හෝ අවසන් කිරීම සිදු කෙරේ. මෙය ආරම්භක සාමාජිකයින්ට ද අදාළ වේ.

6.8.1. මරණය

6.8.2. ඉල්ලා අස්වීම

6.8.3. විනය ක්‍රියාමාර්ග හරහා පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීම

6.8.4. පූර්ව අවසරයකින් තොරව වෙනත් දේශපාලන පක්ෂයකට සම්බන්ධ වීම

6.8.5. දූෂණය, වංචාව, අල්ලස් ගැනීම, ප්‍රචණ්ඩත්වය සහ දුරාචාරය වැනි සමාජ විරෝධී ක්‍රියාකාරකම්වල නියැලීමේ චෝදනා මත අධිකරණයක් හෝ පක්ෂයේ විධායක කමිටුවක් විසින් වරදකරු වීම.

## 7. පරිපාලන ව්‍යුහය **(Organizational Structure)**

7.1.1 නායකත්ව මණ්ඩලය (Leadership Council)

7.1.2 කළමනාකරණ කමිටුව (Management Committee)

7.1.3 දේශපාලන කටයුතු කමිටුව (Political Affairs Committee)

7.1.4 සාමාජික කමිටුව (Membership Committee)

7.1.5 නියෝජිත කමිටුව (Delegates.Assembly)

7.1.6 ජාතික මෙහෙයුම් කමිටුව (National Working Committee)

7.1.7 දිස්ත්‍රික් මෙහෙයුම් කමිටුව (District Working Committee)

7.1.8 ග්‍රාම / නගර / පළාත් පාලන මෙහෙයුම් කමිටුව (Village / City / LGA leval Working Committee)

7.1.9 ප්‍රාදේශීය මෙහෙයුම් කමිටුව (Ward Leval Working Committee)

7.1.10 සියලුම පරිපාලන ව්‍යුහයන් තුළ කාන්තා නියෝජනය සියයට 25 ට නොඅඩු විය යුතුය.

7.1.11 සියලුම පරිපාලන ව්‍යුහයන් තුළ වයස අවුරුදු 18 ත් 35 ත් අතර තරුණයින්ගේ (පිරිමි සහ ගැහැණු) නියෝජනය (10%) ප්‍රතිශතයට වඩා අඩු නොවිය යුතුය.

## 7.2. නායකත්ව මණ්ඩලය (Leadership Council)

නායකත්ව මණ්ඩලය පෙරමුණේ ඉහළම මණ්ඩලයකි.

7.2.1. නායකත්ව මණ්ඩලයේ ව්‍යුහය

7.2.1.1. මෙම සභාව සාමාජිකයින් පහළොස් දෙනෙකුගෙන් (15) සමන්විත විය. ඔවුන්ගෙන් අවම වශයෙන් තුනෙන් දෙකක් (2/3) ආරම්භක සාමාජිකයින් විසින් ආරම්භක සාමාජිකයින්ගේ නම් ලැයිස්තුවෙන් ඡන්දය දීමෙන් තෝරා පත් කරනු ලැබේ.

7.2.1.2. ආරම්භක සාමාජිකයන්ගෙන් නායකත්ව මණ්ඩලයට තේරි පත් වූ අය නායකත්ව මණ්ඩලයේ ඉතිරි තුනෙන් එකක් (1/3) සාමාජිකයින් ආරම්භක සාමාජිකයන්ගෙන් හෝ ක්‍රියාකාරි සාමාජිකයන්ගෙන් ඡන්දයෙන් තෝරා පත් කරනු ලැබේ.

7.2.1.3. නායකත්ව මණ්ඩලයේ නිල කාලය වසර හතරක් (04) වේ.

7.2.1.4. පහත සඳහන් අය නායකත්ව මණ්ඩලයේ (சககியநாசநாசல்) මාණ්ඩලික නිලධිරින් ලෙස ඒකමතිකව හෝ ඡන්දයෙන් තෝරා පත් කර ගනු ලැබේ.

1. සභාපති
2. මහලේකම්

03. භාණ්ඩාගාරික

04. උප සභාපති

05. සහකාර ලේකම්

06. සහකාර භාණ්ඩාගාරික

07. ජාතික සංවිධායක

7.2.2. නායකත්ව මණ්ඩලයේ වගකීම්

7.2.2.1. පක්ෂප්‍රතිපත්තිසකස්කිරීමසහමාර්ගෝපදේශකමූලධර්මසකස්කිරීම

7.2.2.2.උපායමාර්ගික වාර්ෂික සැලසුම් අනුමත කිරීම සහ ව්‍යාපෘති සංවර්ධනය කිරීම

7.2.2.3.අයවැය අනුමත කිරීම

7.2.2.4.පක්ෂයේ වත්කම් නඩත්තු කිරීම සහ මූල්‍ය කටයුතු අධීක්ෂණය කිරීම

7.2.2.5. පක්ෂ යෝජනා ක්‍රියාත්මක කිරීම සහ අවසාන අනුමැතිය ලබා දීම

7.2.2.6.පක්ෂයේ ක්‍රියාමාර්ගය තීරණය කිරීම

7.2.2.7.දේශපාලන ව්‍යුහ ඇතිකිරීම

## 7.3. කළමනාකරණ කමිටුව (Management Committee)

7.3.1. කළමනාකරණ කමිටුවේ ව්‍යුහය

7.3.1.1 අවම වශයෙන් සාමාජිකයින් 05 දෙනෙකුගෙන් සමන්විත වීම

7.3.1.2 කළමනාකරණ කමිටුවේ සාමාජිකයින් නායකත්ව මණ්ඩලය විසින් ශ්‍රේණිගත නිලධාරින් අතරින් තෝරා පත් කරනු ලැවේ.

7.3.1.3.1 කළමනාකරණ කමිටුවේ නිල කාලය වසර 02 කි.

7.3.2. කළමනාකරණ කමිටුවේ වගකීම්

7.3.2.1.නායකත්ව මණ්ඩලය විසින් ගනු ලබන ප්‍රතිපත්තිවු සැලසුම් සහ තීරණ අපේක්ෂිත ප්‍රතිඵල අත්කර ගන්නා පරිදි සුදුසු ආකාරයෙන් සාර්ථකව ක්‍රියාත්මක කිරීම.

7.3.2.2.1.පක්ෂයේ සියලුම පරිපාලන කටයුතු සඳහා වගකීම සහ අධීක්ෂණය කිරීම

## 7.4.දේශපාලන කටයුතු කමිටුව (Political Affairs Committee)

7.4.2. එය නායකත්ව මණ්ඩලය විසින් පත් කරනු ලැබේ

7.4.3. එහි සංඛ්‍යාව කලින් කලට නායකත්ව මණ්ඩලය විසින් තීරණය කරනු ලැබේ

7.4.4. එහි ධුර කාලය වසර 02 කි

7.4.5. පක්ෂයේ දේශපාලන කටයුතු සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම සඳහා මාධ්‍යයක් ලෙස නායකත්ව මණ්ඩලයට අවශ්‍ය දේශපාලන පිළිබඳ උපදෙස් හා මග පෙන්වීම කලින් කලට ලබා දීම.

7.5. සාමාජික කමිටුව(Membership Committee)

7.5.2.එය නායකත්ව මණ්ඩලය විසින් පත් කරනු ලැබේ

7.5.3.එහි සංඛ්‍යාව කලින් කලට නායකත්ව මණ්ඩලය විසින් තීරණය කරනු ලැබේ

7.5.4.එහි ධූර කාලය වසර 02 කි.

7.5.5.පක්ෂයේ සාමාජිකත්වයේ කටයුතු සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම සඳහා මාධ්‍යයක් ලෙස නායකත්ව මණ්ඩලයට අවශ්‍ය සාමාජිකත්වයපිළිබඳ උපදෙස් හා මග පෙන්වීම කලින් කලට ලබා දීම.

**7.6.**නියෝජිත කමිටුව

**7.6.1.** නියෝජිත කමිටුවේ ව්‍යුහය

**7.6.1.1.**එය නායකත්ව මණ්ඩලය විසින් පත් කරනු ලැබේ

**7.6.1.2.**සියලුම ආරම්භක සාමාජිකයින් මේ සඳහා සහභාගී වනු ඇත.

7.6.1.2.1.1එහි සංඛ්‍යාව කලින් කලට නායකත්ව මණ්ඩලය විසින් තීරණය කරනු ලැබේ

7.6.1.2.1.2.නියෝජිත කමිටුවේ වගකීම්

පක්ෂයේ පොදු කටයුතු සම්බන්ධීකරණය සඳහා මාධ්‍යයක් ලෙස නායකත්ව මණ්ඩලයට අවශ්‍ය මනාප හා උපදෙස් හා මග පෙන්වීම කලින් කලට ලබා දීම.

**7.6.1.3.**පක්ෂ ව්‍යවස්ථාව අනුමත කිරීම සහ සංශෝධනය කිරීම නියෝජිත මණ්ඩලයේ බහුතර තීරණයක් මත සිදු වේ.

## 7.7. ජාතික මෙහෙයුම් කමිටුව

පක්ෂයේ ජාතික මට්ටමේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කර ක්‍රියාත්මක කරන ආයතනය ජාතික විධායක කමිටුව වනු ඇත.

7.7.1.ජාතික මෙහෙයුම් කමිටුවේව්‍යුහයහා වගකීම

**7.7.1.1.**ජාතික විධායක කමිටුව පක්ෂයේ නායකත්ව මණ්ඩලයේ ශ්‍රේණිගත සාමාජිකයින් මෙන්ම දිස්ත්‍රික් නියෝජිතයින්ඹ කාන්තාවන් සහ අනෙකුත් කණ්ඩායම්වල නියෝජිතයින්ගෙන් සමන්විත වනු ඇත.

7.7.1.2.ජාතික මෙහෙයුම් කමිටුවේසාමාජික සංඛ්‍යාව කලින් කලට නායකත්ව මණ්ඩලය විසින් තීරණය කරනු ලැබේ

**7.7.1.3.**ජාතික මෙහෙයුම් කමිටුවේධුර කාලය වසර **02** කි.

## 7.8.දිස්ත්‍රික් මෙහෙයුම් කමිටුව

යම් දිස්ත්‍රික්කයක පක්ෂයේ ක්‍රියාකාරකම්වලට අනුකූලව දිස්ත්‍රික් විධායක කමිටුවක් පිහිටුවනු ලැබේ.

7.8.1.දිස්ත්‍රික් මෙහෙයුම් කමිටුවේ ව්‍යුහය හා වගකීම

7.8.1.1.දිස්ත්‍රික් විධායක කමිටු පිහිටුවීම සඳහාඹ අදාළ දිස්ත්‍රික්කයේ අවම වශයෙන් විධායක සාමාජිකයින් 3 දෙනෙකු සහ ආශ්‍රිත සාමාජිකයින් 7 දෙනෙකු සිටිය යුතුය.

7.8.1.2.දිස්ත්‍රික් මෙහෙයුම් කමිටුවේඋපරිම සාමාජික සංඛ්‍යාව **15** කි

7.8.1.3.දිස්ත්‍රික් මෙහෙයුම් කමිටුවේධුර කාලය වසරක් වේ.

7.8.1.4.දිස්ත්‍රික් විධායක කමිටුවේ දිස්ත්‍රික් සම්බන්ධීකාරකඹ ලේකම්ඹ භාණ්ඩාගාරික සහ අනෙකුත් තනතුරු සඳහා නායකත්ව මණ්ඩලයේ අනුමැතිය ඇතිව අවශ්‍ය පරිදි නිර්මාණය කළ හැකිය.

7.8.1.5. දිස්ත්‍රික් විධායක කමිටුව යනු කඩයි හි දිස්ත්‍රික් මට්ටමේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කර ක්‍රියාත්මක කරන කණ්ඩායම වනු ඇත.

## 7.9. ග්‍රාම / නගර / පළාත් පාලන මෙහෙයුම් කමිටුව

යම් ගමක හෝ නගරයක පක්ෂයේ ක්‍රියාකාරකම් අනුවග්‍රාම / නගර / පළාත් පාලන මෙහෙයුම් කමිටුවකමිටුවක් පිහිටුවනු ලැබේ.

7.9.1. ග්‍රාම / නගර / පළාත් පාලන මෙහෙයුම් කමිටුවේ වගකීම

7.9.1.1.1.1 ග්‍රාම / නගර / පළාත් පාලන මෙහෙයුම් කමිටුවක් පිහිටුවීමට අදාල ප්‍රදේශයේ අවම වශයෙන් ආශ්‍රිත සාමාජිකයන්තිදෙනෙක් සිටිය යුතුය.

7.9.1.1.1.2. ග්‍රාම / නගර / පළාත් පාලන මෙහෙයුම් කමිටුවේ දිස්ත්‍රික් මෙහෙයුම් කමිටුවේ උපරිම සාමාජික සංඛ්‍යාව 11 කි

7.9.1.1.1.2.1. ග්‍රාම / නගර / පළාත් පාලන මෙහෙයුම් කමිටුවේ ධුර කාලය වසරක් වේ.

7.9.1.1.1.3.ග්‍රාම / නගර / පළාත් පාලන මෙහෙයුම් කමිටුවේග්‍රාම / නගර / පළාත් පාලන ආයතන සම්බන්දධීකරන ලේකම්,භාණ්ඩාකාර යන තනතුරු පවති. අනෙකුත් තනතුරු අවශ්‍ය වන පරිදි නායකත්ව මණ්ඩලයේ අනුමැතිය ඇතිව නිර්මාණය කළ හැකිය.

7.9.1.1.1.4. පක්ෂයේ ග්‍රාම / නගර / පළාත් පාලන ආයතන මට්ටමේ කටයුතු සම්බන්දධීකරනය කරමින් ක්‍රියාත්මක කරන කමිටුවක් ලෙස ග්‍රාම / නගර / පළාත් පාලන මෙහෙයුම් කමිටුව කටයුතු කරයි.

7.9.1.1.1.5. ප්‍රාදේශීය මෙහෙයුම් කමිටුව

අදාළ කලාපයේ පෙරමුණේ ක්‍රියාකාරකම්වලට අනුකූලව කලාපීය විධායක කමිටුවක් පිහිටුවනු ලැබේ.

7.9.1.1.1.6.ප්‍රාදේශීය මෙහෙයුම් කමිටුවේ ව්‍යුහය හා වගකීම

7.9.1.1.1.7.ප්‍රාදේශීය මෙහෙයුම් කමිටුවපිහිටුවීමට අදාල ප්‍රදේශයේ අවම වශයෙන් ආශ්‍රිත සාමාජිකයන් තිදෙනෙක් සිටිය යුතුය.

7.9.1.1.1.8. ප්‍රාදේශීය මෙහෙයුම් කමිටුවේඋ‍ෙපරිම සාමාජික සංඛ්‍යාව 07 කි

**7.9.1.1.1.9.** ප්‍රාදේශීය විධායක කමිටුවේ නිල කාලය වසරකි.

7.9.1.1.1.10.ප්‍රාදේශීය මෙහෙයුම් කමිටුවේප්‍රාදේශීය සම්බන්දධීකරු, ලේකම් සහ භාණ්ඩාකාර යන තනතුරු පවති.අනෙකුත් තනතුරු අවශ්‍ය වන පරිදි නායකත්ව මණ්ඩලයේ අනුමැතිය ඇතිව නිර්මාණය කළ හැකිය.

7.9.1.1.1.11.පක්ෂයේ ප්‍රාදේශීම මට්ටමේ කටයුතු සම්බන්දධීකරනය කරමින් ක්‍රියාත්මක කරයි

7.11.තනතුරු සහ වගකීම්

7.11.1.සභාපති (Chairman)

**7.11.1.1** නායකත්ව මණ්ඩලය හරහා පක්ෂයට නායකත්වය දීම සහ මඟ පෙන්වීම සහ පක්ෂයේ අරමුණු සහ සැලසුම් සාර්ථකව ඉදිරියට ගෙන යාම.

7.11.1.2පොදුවෙන්කළමනාකරණ කමිටුව සමඟ සාකච්ඡා කිරීමෙන් පසුවඕනෑම තීරණයක්ගත යුතුය.නමුත්,පක්ෂයට හදිසි වැදගත් හෝ තීරණාත්මක තීරණ ගැනීමේදී,නායකත්ව මණ්ඩලය සමඟ සාකච්ඡා කර එම තීරණය කර ගත යුතුය.

7.11.1.3 කළමනාකරණ මණ්ඩලයට නායකත්වය දීම සහ මඟ පෙන්වීම.

7.11.2 නියෝජ්‍ය සභාපති (Deputy Chairman)

7.11.2.1 නායකත්ව මණ්ඩලය මෙහෙයවීම සඳහා සභාපතිනියට සහාය වීම

7.11.2.2 පක්ෂය වෙනුවෙන් නායකත්ව මණ්ඩලය විසින් පවරන ලද කරුණු,වගකීම් සහ රාජකාරි ඉටු කිරීම.

7.11.2.3 සභාපතිවරයා නොමැති විට ඔහුගේ/ඇයගේ වගකීම් සහ යුතුකම් ඉටු කිරීම.

7.11.3. මහලේකම් (General Secretary)

7.11.3.1 පක්ෂයේ නායකත්ව මණ්ඩලය විසින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම

7.11.3.2 විධායක කමිටුව,ජාතික ක්‍රියාකාරී කමිටුව සහ නායකත්ව මණ්ඩලය කැඳවීම සහ කැඳවීම.

7.11.3.3. නායකත්ව මණ්ඩලයේ මඟ පෙන්වීම යටතේ සියලුම රැස්වීම්වල න්‍යාය පත්‍ර සකස් කිරීම. රැස්වීම් වාර්තා සකස් කිරීම. ඡන්දය පැවැත්වෙන අවස්ථාවන්හිදී අභ්‍යන්තර ඡන්දය පැවැත්වීම.

7.11.3.4. සියලුම ලිපි හුවමාරුව පක්ෂයේ ප්‍රතිපත්තියට අනුකූලව සිදු කිරීම

අ. මහලේකම්

ආ. සභාපති

ඇ. ඕනෑම මාන්ඩලික නිලධාරියෙක්

7.11.3.5මැතිවරණ කොමිෂන් සභාව හෝ මැතිවරණ ලේකම් කාර්යාලය සමඟ සන්නිවේදනය, හා නීත්‍යානුකූලව වලංගු කරුණුවලට අදාළ ලියකියවිලිමහලේකම්වරයා විසින් අත්සන් කර ක්‍රියාත්මක කරනු ලැබේ.

7.11.3.6 අනෙකුත් පක්ෂ සහ සංවිධාන සමඟ පක්ෂයේ සබඳතාවල භාරකරු ලෙස කටයුතු කිරීම.

7.11.3.7 පක්ෂයේ වාර්ෂික සැලැස්ම සකස් කිරීම සහ නායකත්ව මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම.

7.11.3.8 නායකත්ව මණ්ඩලයේ අනුමැතියට අනුව ඇති කර ගන්නා ලද ගිවිසුම් අත්සන් කිරීම.

7.11.3.9 පක්ෂ මූලස්ථානයේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස කටයුතු කිරීම

7.11.3.10 නායකත්ව මණ්ඩලය විසින් තීරණය කරන ලද කරුණු ක්‍රියාත්මක කිරීම

7.11.3.11 පක්ෂයේ ප්‍රකාශක ලෙස කටයුතු කිරීම සහ නායකත්ව මණ්ඩලයේ අවසාන තීරණ ප්‍රකාශයට පත් කිරීම

7.11.3.12 පක්ෂයේ මූල්‍ය කටයුතු අධීක්ෂණය කිරීම

7.11.3.13 පක්ෂයේ මහජන සම්බන්ධතා,විදේශ සබඳතා සහ රාජ්‍ය තාන්ත්‍රික කටයුතු පවත්වාගෙන යාම සහ සංවිධානය කිරීම

7.11.4 සහකාර ලේකම් (Deputy Secretary)

7.11.4.1 නායකත්ව මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීමේදී සහ පක්ෂයේ අනෙකුත් පරිපාලන කටයුතු සිදු කිරීමේදී මහලේකම්වරයාට සහාය වීම

7.11.4.2මහලේකම්වරයාට නොමැති අවස්ථාවේදී පක්ෂය වෙනුවෙන් මහලේකම්වරයාගේ වගකීම් සහ රාජකාරි ඉටු කිරීම.

7.11.5 ජාතික සංවිධායක (National Organizer)

7.11.5.1 පක්ෂයේ සාමාජික ව්‍යුහයට වගකිව යුතු පුද්ගලයා ලෙස කටයුතු කිරීම

7.11.5.2 ජාතික,දිස්ත්‍රික් සහ ග්‍රාමීය මට්ටමේ ක්‍රියාකාරී කමිටු පිහිටුවීම

7.11.5.3 දිස්ත්‍රික් මට්ටමේ සාමාජික රැස්වීම් පැවැත්වීම

7.11.5.4 ජාතික,දිස්ත්‍රික් සහ ග්‍රාමීය මට්ටමින් කාන්තා තරුණ කණ්ඩායම් වැනි ව්‍යුහයන් සංවිධානය කිරීම

7.11.5.5 සාමාජිකයින් සඳහා පුහුණුව සංවිධානය කිරීම

7.11.6 භාණ්ඩාගාරික (Treasurer)

7.11.6.1 පක්ෂයේ සියලුම මූල්‍ය කටයුතු සඳහා වගකිව යුතු පුද්ගලයා ලෙස කටයුතු කිරීම.

7.11.6.2 සියලු ආකාරයේ බැංකු ගිණුම් සහ මූල්‍ය ගනුදෙනු සඳහා ප්‍රධාන වගකීම දරන්නෙකු ලෙස කටයුතු කිරීම හාඅදාළ සියලුම ලිඛිත ලේඛන නඩත්තු කිරීම සහ ඒවාට වගකීම් දැරීම.

7.11.6.3 පක්ෂයේ අයවැය සකස් කර නායකත්ව මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම.
7.11.6.4 පක්ෂයේ මූල්‍ය රෙගුලාසිවලට අනුකූලව මූල්‍ය ගනුදෙනු සිදු කරන බවට වග බලා ගනීම.

7.11.7 සහකාර භාණ්ඩාගාරික (Assistant Treasurer)

7.11.7.1 පක්ෂයේ මූල්‍ය මෙහෙයුම් සඳහා භාණ්ඩාගාරිකට සහාය වීම

7.11.7.2 භාණ්ඩාගාරික නොමැති විට පක්ෂයේ මූල්‍ය මෙහෙයුම් සඳහා වගකිව යුතු වීම

8 මූල්‍ය ක්‍රියාකාරකම්

8.1.**1.1**මූල්‍ය ආයකත්වයන්

8.1.1. පරිත්‍යාග

8.1.2 තෑග්ග

8.1.3. සාමාජිකයින්ගෙන් ලැබෙන ආයකත්වයන්

8.1.4 ආපදා සහන දායකත්වයන්

8.1.5. සුභ පතන්නන්ගෙන් ලැබෙන දායකත්වයන්

8.2. මූල්‍ය අයදුම්පත්

8.2.1 රු. ලක්ෂයක් (100,000.00) දක්වා වියදම් භාණ්ඩාගාරික විසින් සභාපතිවරයාගේ හෝ මහලේකම්වරයාගේ අනුමැතිය ඇතිව සිදු කළ යුතුය

8.2.2. රු. ලක්ෂයක සිට රුපියල් ලක්ෂ පහ දක්වා (100,000.00 -500,000.00) වියදම් භාණ්ඩාගාරික විසින් නිලධාරී මණ්ඩලයේ ලිඛිත අනුමැතිය ඇතිව සිදු කළ යුතුය

8.2.3. විශේෂ අවශ්‍යතා සඳහා අරමුදල් භාවිතය නායකත්ව මණ්ඩලයේ බහුතර සාමාජිකයින්ගේ අනුමැතිය ඇතිව සිදු කළ යුතුය.

8.2.4. බැංකු ගිණුම්/චෙක්පත් භාණ්ඩාගාරික, සභාපතිවරයා හෝ මහලේකම්වරයාගේ අත්සනින් ක්‍රියාත්මක කළ යුතුය.

9. මූල්‍ය වර්ෂය

9.1 මූල්‍ය වර්ෂය ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා වේ.

9.2 මූල්‍ය ප්‍රකාශන ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා කාලය ආවරණය කරයි.

9.3. ප්‍රඥප්තියේ 11 වන වගන්තියට අනුකූලව විගණන වාර්තාව වාර්ෂිකව මාර්තු 31 වන දින ඉදිරිපත් කෙරේ.

10. අභ්‍යන්තර විගණක

10.1 පක්ෂයේ මූල්‍ය කළමනාකරණ කටයුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට සහ පක්ෂයේ තීරණවලට අනුකූලව සිදු කරන බව සහතික කිරීම.

10.2 සාමාජිකයින් අතරින් සුදුසුකම් ලත් පුද්ගලයෙකු පක්ෂ සාමාජිකයින් විසින් මහා සභා රැස්වීමකදී අභ්‍යන්තර විගණක ලෙස තෝරා පත් කර ගත යුතුය.

10.3 ඔහුට රැස්වීම්වලදී ඡන්දය ප්‍රකාශ කිරීමට අයිතියක් නැත.

10.4 සියලුම රැස්වීම්වලට සහභාගී වී එලදායී අදහස් ප්‍රකාශ කිරීමට.

10.5. පක්ෂයට පක්ෂපාතීව කටයුතු කිරීම

11. බාහිර විගණක.

11.1 වාර්ෂික මහා සභා රැස්වීමේදී සුදුසුකම් ලත් ලියාපදිංචි විගණන සමාගමක් බාහිර විගණක ලෙස තෝරා පත් කරනු ඇත.

12.වාර්ෂික මහා සභා රැස්වීම

12.1පක්ෂයේ ක්‍රියාකාරකම් පිළිබඳ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශය වසර අවසන් වීමෙන් පසු මහා සභා රැස්වීමේදී ඉදිරිපත් කිරිම.

12.2ජාතික සම්මේලනය පක්ෂයේ වාර්ෂික මහා සභා රැස්වීමක්වේ.මෙම අවස්ථාවෙදී,වාර්ෂික භාණ්ඩාගාරික වාර්තාව සහ භාණ්ඩාගාරික මූල්‍ය වාර්තාව අදාළ මට්ටම්වලදී ඉදිරිපත් කරනු ලැබේ.

**12.3**නියෝජිත සම්මේලනයේ රැස්වීමට අදාල ආරාධනා පත්‍රය මහලේකම්වරයා විසින් රැස්වීමේ දිනට සති දෙකකට පෙර සුදුසු ආකාරයෙන් එවිය යුතුය.

12.4 සෑම වසරකම දිස්ත්‍රික්,ග්‍රාම,නගර හෝ පළාත් පාලන කොට්ඨාශ මට්ටමින් වාර්ෂික රැස්වීමක් පැවැත්වේ. මේ අතරතුර,අදාළ මට්ටම්වල වාර්ෂික ලේකම්වරයාගේ වාර්තාව,භාණ්ඩාගාරික වාර්තාව ඉදිරිපත් කරනු ලබන අතර නව නිලධාරීන් තෝරා පත් කර ගනු ලැබේ.

12..5 වාර්ෂික මහා සභා රැස්වීම සඳහා වන ආරාධනා පත්‍රයරැස්වීම පැවැත්වෙන දිනට සති දෙකකට පෙර අදාළ මට්ටම්වල අදාළ ලේකම්වරුන් මඟින් සාමාජිකයින් වෙත යවනු ලැබේ.

12.6 වාර්ෂික මහා සභා රැස්වීම සඳහා ගණපූරණය සියයට පනහක් (50%) විය යුතුය.

12.7සාමාජිකයින්ගෙන් තුනෙන් දෙකකගේ ඉල්ලීම පරිදි, අවශ්‍ය හෝ හදිසි යැයි සැලකෙන විශේෂ පූර්ණ සැසියක් මහලේකම්වරයා විසින් සතියක දැනුම්දීමක් සහිතව කැඳවිය හැකි අතර, එයට විශේෂ න්‍යාය පත්‍රයක් පමණක් ඇතුළත් විය යුතුය.

13. පක්ෂ චර්යාධර්ම සංග්‍රහය

13.1 මණ්ඩලය පක්ෂ චර්යාධර්ම සංග්‍රහය සකස් කර ක්‍රියාත්මක කරයි.

13.2 සාමාජිකයින් පක්ෂයේ ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව කටයුතු කිරීම නිලධාරීන්ගේ යුතුකමකි.

13.3 චර්යාධර්ම සංග්‍රහයට අනුකූලව පක්ෂ සාමාජිකයින් අත්හිටුවීමට සහ නෙරපා හැරීමට නායකත්ව මණ්ඩලයට බලය ඇත.

14. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ අර්ථ නිරූපණය සහ අවසාන තීරණය

14.1 පක්ෂයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීම සහ අධිකරණ සමාලෝචනය කිරීමේ බලය නායකත්ව මණ්ඩලයට ඇත.

14.2 පක්ෂයට අදාළ සියලු කාරණා සහ ආරවුල් වලදී, නායකත්ව මණ්ඩලයේ තීරණය අවසාන තීරණය විය .

14.3 අවසාන තීරණය වලංගු වන්නේ නායකත්ව මණ්ඩලයේ සාමාජිකයින්ගෙන් සියයට පනස් එකක (51%) මනාපයඅනුව පමණි.

15. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

15.1 ආරම්භක සාමාජිකයින්ගෙන් 2/3 (තුනෙන් දෙකක) අනුමැතිය මත නායකත්ව මණ්ඩලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් යෝජනා කළ යුතුය

15.2 1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා නායකත්ව මණ්ඩලයේ යෝජනාව නියෝජිත සමුළුවේ සාමාජිකයින්ගෙන් සියයට 51 (51%) කැමැත්ත මත සම්මත කරනු ලැබේ.

Sgd. M. Chandrakumar
M.Chandrakumar
Ex MP & DCC Parliament
General Secretary
Samaththuva Kadchi

M. Chandrakumar
Ex MP & DCC Parliament
General Secretary
Samaththuva Kadchi

භාෂා පරිවර්තක
25-02-2026
S.JOHN BAPTIS
Sworn Translator
English, Tamil & Sinhala
Appointed by Ministry of Justice
Regd No: Aa/11/192
Justice of the Peace (Whole Island)
Former Grama Officer
Anandapuram, Kilinoch...